# සාරාංශය


## කොළඹ හිල්ටන් හෝටලය ඉදිකිරීමේදී

# ශ්‍රී ලංකා රජයට සිදුවූ මහා පරිමාණ වංචාව

## *ශ්‍රී ලංකාවේ පළමුවන ව්‍යුත්පන්න නඩුව*

***Google Books** – '[Colombo Hilton Hotel Construction - Fraud on Sri Lanka Government – Vol. 1 – Sri Lanka's First Derivative Action in Law](#)'*

http://www.consultants21.com/page-1-derivative-actions-in-law.php




*විශාලත්වය - 8.25" X 11" - පිටු ගණන 500*

මෙම ග්‍රන්ථය මගින් හෙළිදරව් කරනු ලබන්නේ, 1983 වර්ෂයේ 'කළු ජූලි' කෝලාහලයට පසු, ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ප්‍රතිරූපය මිලේච්ඡ ලෙස විවේචනයට ලක්වීම නතර කිරීමට සහ ශ්‍රී ලංකාවේ නාමය නැවත කීර්තිමත් තත්වයකට ගොඩ නැංවීම අරභයා, ජනාධිපති ජේ. අර්. ජයවර්ධන ප්‍රමුඛ ආණ්ඩුව, හිල්ටන් හෝටල් ව්‍යාපෘතිය කොළඹ ස්ථාපිත කිරීම උදෙසා උනන්දුව සහ අනුග්‍රහය දැක්විම සහ ඉන් අනතුරුව ශ්‍රී ලංකා රජයට සිදු කරන ලද මහා පරිමාණ වංචාව පිළිබඳවය.

ඒ අනුව, හිල්ටන් හෝටල් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී, විදේශ ණය ලබා ගැනීම පිණිස, රජයේ ඇපකර පළමු වතාවට පෞද්ගලික සමාගමකට ලබා දෙනු ලැබිය. එවකට අගමැති ආර්. ප්‍රේමදාසගේ දායකත්වය මත, කොළඹ නගරයේ රජය සතු ඉඩමක්, අවුරුදු 99ක බද්දකට, ඉතාමත් සහනදායී අවුරුදු 30 ක පොලි රහිත ගෙවීම් ක්‍රමයකට, නාගරික සංවර්ධන අධිකාරිය විසින් මෙම හිල්ටන් හෝටල් ව්‍යාපෘතිය ගොඩනැගීමට ලබා දෙන ලදී.

ප්‍රතිඵලය වශයෙන්, කොනල් සහ සමාගම ප්‍රමුඛ ප්‍රවර්ධකයා වශයෙන්ද, ඩෙල්මේජ් ෆොර්සායිත් සමාගම, කළමනාකරණ උපදේශකයෙකු වන කර්තෘ සහ නීතිඥ, එම්. රාධක්‍රිෂ්නන් අනිකුත් ප්‍රවර්ධකයන් හැටියටද, හිල්ටන් හෝටල් ව්‍යාපෘතිය තැනීම 1984 මාර්තු මස ආරම්භ කළේ, එක්සත්

ජනපද හිල්ටන් ඉන්ටර්නැෂනල්හි කළමණාකාරීත්වය සහ තාක්ෂණික සහායද ලබාගෙන, ජාත්‍යන්තරයේ පිළිගත් බහු ජාතික සමාගම් වන ජපානයේ මිට්සුයි සහ තායිසේ සමාගම්, රජයේ ඇපකර මත, බහුතර කොටස් හිමිකාරිත්වය ශ්‍රී ලංකා රජය සතුකර ගෙන, හිල්ටන් හෝටලය අංග සම්පූර්ණ ලෙස සාදා නිමකිරීමට ඔවුන් විසින්, රජයේ ඇපකර මත, ගෙවිය යුතු මුදල ණයක් වශයෙන් වාරිකව ගෙවීමේ පදමන මතය. මෙම ව්‍යපෘතියේ ගෘහ නිර්මාණ ශිල්පීන් වුයේ ජපානයේ සුප්‍රසිද්ධ කැන්කෝ් කිකාකු සෙක්කෙෂියා යොෂෝ ෂිබාටා සමාගමයි.

මහත් උත්කර්ශවත් අන්දමින්, ජනාධිපති ජේ. අර්. ජයවර්ධන, අගමැති ආර්. ප්‍රේමදාස සහ අනෙකුත් ප්‍රභුවරුන්ගේ සහභාගිත්වයෙන්, මෙම හිල්ටන් හෝටලය 1987 වසරේ විවෘත කොට, සිය මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලදී. හිල්ටන් හෝටලය අයිති සමාගම හොටෙල් ඩිවර්ලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගම නම් විය.

හිල්ටන් හෝටල් ව්‍යපෘතිය පහත දැක්වෙන ඡායාරූපය අනුව කුළුණු 3 කින් යුතුව ගොඩනැගීමට සැලසුම් කර තිබුණි. එය මහල් 19 ක් සහ කාමර 684 කින් සමන්විත විය. බිම් මහලෙහි මෝටර් රථ 450 ක් ගාල් කිරීමට සහ හෝටලයකට අවශ්‍ය වෙනත් පහසුකම් වන ප්‍රධාන ශාලා, ආපනශාලා, සුපිරි වෙළඳසැල්, විවේකාගාර, සන්නිවේදෙන මධ්‍යස්ථාන, පිහිනුම් තටාක, ක්‍රීඩා පිටි සදහා ඇතුලත් කොට තිබුණි.



කෙසේ වෙතත්, පළමුවන අදියර සැලසුම් කොට තිබුණේ කුළුණු 2 කින් පමණක් වූ අතර, 3 වන කුළුණ සඳහා සම්පූර්ණ අත්තිවාරම දමා, එම 3 වන කුළුණ භාවිතා කිරීම සඳහා විදුලි සෝපාන 2 ක් සවි කිරීමට ඉඩ පහසුකම්ද වෙන්කර තිබු අතර, පසුව එම 3 වන කුළුණ පහසු ලෙස ගොඩනැගීමට සැලසුම් කර තිබුණි. ඒ අනුව පළමුවන අදියරේදී කුළුණු 2 ක් ගොඩනැගු අතර, කාමර 456කින් යුක්ත මහල් 19 කින්, එම හිල්ටන් හෝටල් ව්‍යාපෘතිය සමන්විත විය.

රජයේ ඇපකර මත, ජපානයෙන් ගනු ලබන ණය ආපසු ගෙවීමේ ශක්තිය පිලිඹිබු කිරීමට, හිල්ටන් ඉන්ටර්නැෂනල් සමාගම විසින් හිල්ටන් හෝටල් ව්‍යාපෘතියේ ලාභ ගණනය කර තිබුණේ, කුළුණු 2 ක් සහිතව තට්ටු 19 කින් සහ කාමර ගණන 456 කින් සමන්විත වී තිබු පදනම මතය.

Extracts from Mitsui & Co. Ltd.'s Profitability Forecast & Cash Flow Projections of October 1983 –
**456 Guests Rooms**

| Year | | 1st | 2nd | 3rd |
|---|---|---|---|---|
| Total No. of Rooms (Room Days) Available (for year) i.e. 456 Rooms x 365 Days | (A) | 166440 | 166440 | 166440 |
| Room Occupancy - % | (B) | 65% | 70% | 75% |
| Average Room Rate – US $ | (C) | 73.00 | 78.84 | 85.15 |
| Room Revenue – US$ ' 000 (A) x (B) x (C) | | 7898 | 9185 | 10629 |
| Net Funds Available US $ '000 | | 5180 | 6403 | 7651 |
| Jap Yen '000 (1 US$ = 230 Jap Yen) | | 1191400 | 1472690 | 1759730 |

1987 ජුලි මස හෝටලය විවෘත කිරීමෙන් පසු මාසික මෙහෙයුම් වාර්තා නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව, කාමර ගණන 387කින් සමන්විත තට්ටු 17 ක් පමණක් තිබු බව දැක්වීම හොටෙල් ඩිවර්ලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යාක්ෂකවරයෙකු වූ කර්තෘගේ සැකයට භාජනයවීම මෙයින් එළිදරව් කර ඇත.

| | | | |
|---|---|---|---|
| No. of Rooms (Room Days) Available (For Year) i . e. 387 Rooms x 365 Days | 141255 | 141255 | 141255 |
| Room Occupancy | 20% | 30% | 40% |
| Average Room Rate US$ | 40.0 | 50.0 | 60.0 |
| Room Revenue - US$ '000 | 1130 | 2119 | 3390 |

| | | | |
|---|---|---|---|
| Total Revenue - US$ '000 | 4800 | 5298 | 7614 |
| Gross Operating Profit - US$ ‘000 | 0 | 350 | 1904 |
| G.O.P. Rate | 0 | 0 | 25% |
| Net Funds Available - US$ '000 | 0 | 0 | 1421 |

එම සැකසහිත තත්වය මතුයෙහි, මුදල් අමාත්‍යාංශයේ සහායද ඇතිව, හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂකවරයෙකු ලෙස කර්තෘ විසින් තවදුරටත් ගවේෂණය කරන ලදී. එමගින්, හිල්ටන් ව්‍යපෘතියේ 1983 වසරේ මුල් ගෘහනිර්මාණ සැලසුම් මත පදනම්ව, 1984 වසරේ තැනීම් ආරම්භ කිරීමෙන් පසුවය.

Ministry of Local Government, Housing and Construction

නාගරික සංවර්ධන අධිකාරිය
நகர அபிவிருத்தி அதிகாரசபை
urban development authority

Telephones 92021, 91368, 92296, 92768, 596271

P. O. BOX 1895

27, D R Wijewardena Mawatha, Colombo 10

Ref: 02/20/523/83
5th March 1984

Project Co-ordinator,
Hotel Developers (Lanka) Ltd.,
16, Alfred Place,
Colombo - 3.

Dear Sir,

Proposed Hilton Hotel Project at
Echelon Square Colombo 1.

Reference your building application dated 19.10.83 submitted to this Authority.

I have to inform that your plans are approved subject to the following conditions:-

XXXXXXXXXXXXX


A set of approved plans duly certified is sent herewith and the building permit will be issued in due course. Please submit 3 additional copies of the plans to enable the permit to be issued.

Yours faithfully,
Sgd/ R.Paskaralingam,
Chairman,
Urban Development Authority

G. L. D. de Silva
Dy.Director (Dev.Reg.)


c.c: 1. Municipal Engineer. Col.
2. Chief Officer, Fire Brigade Col.

1986 වසරේ රහසිගත ලෙස මුල් ගෘහනිර්මාණ සැලසුම් වෙනස් කොට තිබූ බවට නාගරික සංවර්ධන අධිකාරියෙන් තහවුරු වූ බවත්, එම මුල් සැලසුම් එකක්වත් නාගරික සංවර්ධන අධිකාරියේ, කොළඹ මහා නගර සභාවේ සහ අනෙකුත් අදාල ආයතන වලද නොතිබුණු බවත් හෙළිදරව් විය.



නාගරික සංවර්ධන අධිකාරිය
සංවර්ධන රෙගුලාසි අංශය.
අනුමත සැලසුම.............................දින දරණ
අංක 02/ ..........................................
බලපත්‍රයේ අඩංගු කොන්දේසි වලට යටත් වනු ඇත.
URBAN DEVELOPMENT AUTHORITY
DEVELOPMENT REGULATIONS DIVISION
APPROVED PLAN
SUBJECT TO THE CONDITIONS LAID DOWN
IN PERMIT No. 02/20/523/83
DATED 29.09.86
.............................................
සභාපති නා. ස. අ. / Chairman U. D. A.

හිල්ටන් හෝටල්  කාර්යාලයේ තිබූ මුලික සැලසුම් වල පිටපතද සැක සහිත ලෙස හිල්ටන් හෝටල් ව්‍යාපෘතියේ ගෘහ නිර්මාණ ශිල්පීන් වන ජපානයේ සුප්‍රසිද්ධ කැන්කෝ කිකාකු සෙක්කෙෂියා යොෂෝ ෂිබාටා සමාගම විසින් ඉල්ලා ගෙන ඇති අතර, එවැනි අවස්ථාවක, හිල්ටන් හෝටල් ව්‍යාපෘතිය ගොඩනැගීමේ අදාල කාර්යාලයේ එක් රාත්‍රියක පුදුම සහගත ලෙස ගින්නක් හට ගෙන, එහි තිබූ සියලු බඩු භාණ්ඩ ඇතුළු ගෘහනිර්මාණ සැලසුම් සහ ලේඛන විනාශයට පත්වූ බව වාර්තා විය.



Photocopy Obtained from File HDC Office
File "UDA Permits & Approvals" LJH/HP/1/4 (14)

The original of the letter given by the UDA on 23/March/84 (Ref. 02/20/523/83 on building permit) is with Mr. Kitagawa KKS together with the set of approved set of plans.
27/7/90.
27/7/90

Approved plans by UDA.
A-01
A-02
A-03
A-04.
A-20
A-21
A-22
A-23
A-24
A-25
A-26
A-27
A-30
A-31.
with Mr. Kitagawa of KKS.

Approved by Fire Dept.
C-01
A-09
A-19
A-20
A-21
A-22.
A-28
with C.O. of HDC.

The original of the letter given by UDA on 23/3/84 Ref 02/20/523/83 was got burned in the fire that occurred in the site office in 1984 together with the originally approved plans. Later amended plans were submitted & approval obtained. The approved plans are with Mr. Kitagawa of KKS.
[signature]

මෙම ගින්න හට ගැනීම පිළිබඳ කොළඹ කොටුව පොලිසියෙන් ඉදිරිපත් කළ වාර්තාව ව්‍යාජ ලේඛනයක් යයි පසුව විමර්ශනය කළ විශේෂ ජනාධිපති කොමිසම ඉදිරියේ කොළඹ කොටුව පොලිසිය විසින් සාක්ෂි දෙමින් තහවුරු කරන ලදී.

**REPORT FROM MITSUI TAISEI CONSORTIUM**

**Report on the fire-incident which occurred on 18th October 1985 at the Hilton Hotel Site**

XXXXXXXXXXXX

(3) All drawings and documents got burnt. Our principles in Tokyo dispatched all drawings, documents etc., they possessed, which arrived in Colombo on 26.10.85 to replace the ones that got burnt.

ඊට අමතරව, හිල්ටන් හෝටලයට අවශ්‍ය උපකරණ සහ අනිකුත් සැපයුම් නිශ්චය කර තිබූ කොන්ත්‍රාත්තුවේ ලේඛනයද රහසිගතව අස්ථානගතවී තිබුණි. ඒ අනුව හිල්ටන් හෝටලය තැනූ පිරිමිති සහ උපකරණ ඇතුළු අනෙකුත් සැපයුම් පරික්ෂා කොට සනාථ කර ගැනීමේ අවස්ථාව ගිලිහී ගොස් තිබුණි.

මෙය වංචාවක් ලෙස කර්තෘ විසින් එළිදරව් කොට සනාථ කර තිබූ නමුත්, හිල්ටන් හෝටලය අයිති සමාගම වන හොටෙල් ඩිවර්ලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය ඒ පිළිබඳ කිසිම ක්‍රියා මාර්ගයක් නොගෙන නිහඬව සිටි.

මෙම ජපන් සමාගම් රජයේ ඇපකර ලබා ගෙන සිටියදීත්, ඊට අමතරව, මෙකී සමාගම් විසින් කොළඹ හිල්ටන් හෝටලය ඔවුන් වෙත උකස් කර ගැනීම සඳහා, 1989 නොවැම්බර් මාසයේ දී, හොර රහසේ, ගිවිසුමක් අත්සන් කර ගෙන තිබුණි. කර්තෘ, හොටෙල් ඩිවර්ලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ ලෙස, ශ්‍රී ලංකා රජය විසින් පත් කල හොටෙල් ඩිවර්ලොපර්ස් (ලංකා) ලිමිටඩ්හි අධ්‍යක්ෂ වූ, ආර්ථික කටයුතු පිළිබඳ අතිරේක අධ්‍යක්ෂ, ආචාර්ය ඒ. සී. රන්දෙනිගේද සහාය ඇතිව, සාර්ථකව සහ ප්‍රබල ලෙස එම ප්‍රයත්නයට විරුද්ධ වී, ඔවුන්ගේ එකී කැපවීමේ ප්‍රතිඵලය ලෙස, එම රහස් ගිවිසුම 1990 මැයි මාසයේ දී අවලංගු කර ගෙන තිබුණි - *එනම්:*

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

ජනාධිපති මාවත,
තැපැල් පෙට්ටිය 590,
කොළඹ-1.

Janadhipathi Mawatha,
P. O. Box 590,
Colombo-1.
Telegrams: 'CENTRABANK'

29-11-1989

My No.

Strictly Confidential

Your No.

24th November, 1989.

89-11-28

Mr.R. Paskaralingam
Secretary,
Ministry of Finance,
Colombo.

Dear Sir,

**Proposal to Mortgage the Assets of Hotel Developers Ltd.**

"Dr. Randeni referred to the request made by Mr. Nihal Amarasekera at the Board Meeting held on 30th October, to table the agreements signed by HDL with respect to the postponement of loan repayments due upto the end of 1989, and said that he received the copies of the documents signed by HDL.

XXXXXXXXXXXX

Yours faithfully,

Dr.A.C.Randeni,
Additional Director of Economic Research and
Director of Hotel Developers Ltd.
representing the General Treasury.

එ බැවින්, කර්තෘ විසින් ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට හිල්ටන් හෝටලයේ කොටස්කරුවකු ලෙස, ඉහත කී ජපන් සමාගම් වලට සහ සමාජ-දේශපාලනික බලය මත, බලපෑම් කරන, වංචාකාරී දුර්ජනයන්ට එරෙහිව ව්‍යුත්පන්න නඩුවක් 1990 සැප්තැම්බර් මස කොළඹ දිස්ත්‍රික් අධිකරණයේ ගොනු කළේය.

මෙම නඩුවේ විත්තිකරුවන් වූයේ ඉහතකී ජපන් සමාගම් සහ හිල්ටන් හෝටලය අයිති සමාගම වන හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ වැරදි සහගත ලෙස ක්‍රියා කළ අධ්‍යක්ෂවරුන් විත්තිකරුවන් ලෙස නම්කර, ව්‍යුත්පන්න නඩුවක අවශ්‍යතාවය මත, හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමගම විත්තිකරුවෙකු ලෙස නම්කර තිබුණේ අධිකරණයෙන් සහන ලබා ගැනීමටය.

හිල්ටන් හෝටලයේ ඉදිකිරීම් සිදු කර ඇත්තේ, රජයේ ඇපකරු ලෙස, ශ්‍රී ලංකා රජයේ අනුමැතිය පරිදි නොවන බවත්, එබැවින් ශ්‍රී ලංකා විදේශ ණය ලබා ගැනීම මත, ජාත්‍යන්තර බාධා කිරීම් සහ තර්ජනයන්ද හමුවේ, 1990 සැප්තැම්බර් මස මෙම ව්‍යුත්පන්න නඩුව ගොනු කළ විගසම, කොළඹ දිස්ත්‍රික් අධිකරණය විසින්, ජපන් සමාගම් වලට, රජයේ ඇපකර මතද, කිසිදු ගෙවීමක් නොකරන ලෙසට වහාම වාරණ නියෝග පනවන ලදී .

එසේ කොළඹ දිස්ත්‍රික් අධිකරණය විසින් 1990 සැප්තැම්බර් මස තහනම් නියෝගයක් පැනවීමෙන්, බැලූ බැල්මට නඩු නිමිත්තක් තිබේ යයි සනාථ වී තිබුණත්, ඉන්පසුව මෙම වංචාව යටපත් කිරීමට තැත් කිරීමක් ලෙස සුප්‍රසිද්ධ KPMG ෆෝර්ඩ් රෝඩ්ස් තෝන්ටර්න් විගණකාධිකාරී සමාගම විසින් වංචා සහගත ලෙස විගණනය කළ ගිණුම් වාර්තාවක් ඉදිරිපත් කර තිබුණේ, කර්තෘ හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂකවරයෙකු වශයෙන් ඉදිරිපත් කළ විරෝධතාවයද නොතකා හරිමිනි.

## Hotel Developers (Lanka) Ltd.

**REPORT OF THE AUDITORS**

**To The Members of Hotel Developers (Lanka) Limited**

We have examined the balance sheet of Hotel Developers (Lanka) Limited, as at 31st March 1990 and the related statement of profit and loss for the period then ended. Our examination was made in accordance with Sri Lanka Auditing Standards. We have obtained all the information and explanations which to the best of our knowledge and belief were necessary for purposes of our audit.

In our opinion, so far as appears from our examination, proper books of accounts have been maintained by the company and to the best of our information and according to explanations given to us, the balance sheet and statement of profit and loss which are in agreement therewith read together with the notes referred, provided the information required by the Companies Act, No. 17 of 1982, and subject to note 19 to the Accounts, give a true and fair view of the state of affairs of the Company as at 31st March 1990 and of its loss for the year then ended in conformity with generally accepted accounting principles applied on a basis consistent with that of the previous year.

We further report that according to information available to us, no Director of the company is directly or indirectly interested in a contract with the company other than those disclosed in Note 18 to the accounts.

**Ford Rhodes, Thornton & Company**
*Chartered Accountants*
28th November, 1990

එමනිසා, 1991 ජනවාරි මස කර්තෘ හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂකවරයෙකු වශයෙන්, එම ගිණුම් වාර්තාවද විමර්ශනයට ලක්කොට, වංචනික පදනමක් මත එය අභියෝගයට ලක්කරමින්, තවත් ව්‍යුත්පන්න නඩුවක් කොළඹ දිස්ත්‍රික් අධිකරණයේ ගොනු කළ අතර, කොළඹ දිස්ත්‍රික් අධිකරණය විසින් එම වංචා සහගත ගිණුම් තහනම් නියෝගයක් පනවමින් වහාම අත්හිටුවන ලදී.

ඉන්පසුව නිතීමය අවශ්‍යතාවයක් මත, KPMG ෆෝර්ඩ් රෝඩ්ස් තෝන්ටර්න් විගණකාධිකාරී සමාගමද විත්තිකරුවෙකු ලෙස මෙම නඩුවට ඇතුලත් කිරීමට හොටෙල් ඩිවර්ලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂකවරයෙකු ලෙස පැමිණිලිකාර කර්තෘ විසින් ඉල්ලීමක් කර තිබුණි. ගරු. නීතිපතිතුමා මෙම නඩුව ඉදිරියට ගෙන නොයාමට තීරණය කර කටයුතු කළේ, එහි සත්‍ය යථාර්ථය ඔහු විසින් අවබෝධ කර ගනිමිනි.

ඉහත කී වංචාව වසන් කිරීමට ජපන් සමාගම් සහ හිල්ටන් හෝටලයේ අයිති සමාගම වන, හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයද KPMG ෆෝර්ඩ් රෝඩ්ස් තෝන්ටර්න් විගණකාධිකාරී සමාගම සමග හවුල්වීම බරපතල වරදක් සේ හුවා දක්වා ඇත.

පසුව 1996 ඔක්තෝබර් මස ශ්‍රී ලංකා වාණිජ මහාධිකරණයේ තීන්දු ප්‍රකාශයක් මගින්, වෙනත් කරුණු අතර, නියෝග කර තිබුණේ, KPMG ෆෝර්ඩ් රෝඩ්ස් තෝන්ටර්න් විගණකාධිකාරී සමාගම විගණකාධිකාරී ධුරයෙන් ඉවත් කොට, හිල්ටන් හෝටලය අයිති සමාගම වන, හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ ගිණුම් හරියාකාරව නැවත සැකසීම සහ විගණනය කිරීම සඳහා වෙනත් වරලත් ගණකාධිකාරී සමාගමක් විගණනකරුවන් ලෙස පත් කිරීමටය.

කර්තෘගේ 1990 සැප්තැම්බර් මස ගොනු කළ පළමු නඩුවේ විමර්ශනයේදී, ඉතාමත් ප්‍රබල වාචික සහ ලිඛිත දේශන ඉදිරිපත් කිරීමෙන් පසු, කොළඹ දිස්ත්‍රික් අධිකරණය එම ජපන් සමාගම් වලට, රජයේ ඇපකර මතද, සියලු ගෙවීම් නතර කරමින්, අතුරු තහනම් නියෝග 1991 ඔක්තෝබර් මස නිකුත් කරන ලදුව, වෙනත් කරුණු අතර මෙසේ ද නිරීක්ෂණය කර සිටියේය.

- **කොන්ත්‍රාත්කරුවන් විසින් අඩු වැඩ ප්‍රමාණයක් කර වැඩි මුදල් ප්‍රමාණයක් ලබා ගැනීමට වැයම් කර ඇත ..... මුදල් ගෙවීමේ පදනමට අදාළ වන ප්‍රශ්ණ පැමිණිලිකරු විසින් මතු කරනු ලැබ .....**

- **අනිකුත් විත්තිකරුවන් (එනම් අධ්‍යක්ෂවරයන්) එකී හෝටල් ව්‍යාපාරය සමග සම්බන්ධතා ඇති තැනැත්තන් වශයෙන් එම කාරණයේදී මැදිහත් වී මුදල් ලබා ගැනීමට ක්‍රියා කරමින්, නිවැරදි පරීක්ෂණයක් වහාම සිදු කිරීමට ක්‍රියා කර නැත.**

- **ඔවුන් විසින් එවැනි නිවැරදි පරීක්ෂණයක් කිරීම වළක්වා, කවරාකාරයෙන් හෝ මුදල් ගෙවීමට උත්සාහ ගෙන ඇත.**

- ගිවිසුම් වලට ....... සම්බන්ධ වැඩ පිළිබඳ කාරණා වලට අදාළ ප්‍රශ්ණ මතු කිරීම වලක්වාලීම පිණිස, ඔවුහු සමාගම සමග එකතු වී, ඔවුන් සමාජයෙහි දරණ තත්වය ප්‍රයෝජනයට ගනිමින් බලපෑම් කරමින් සිටිති.

- එකී තැනැත්තන්ගේ සහයෝගීත්වය සමාගමේ කොටස්කරුවන්ගේ යහපතට අහිතකර වේ. එම සහයෝගීත්වය මාර්ගයෙන් ඔවුහු සමාගමේ කොටස්කරුවන්ගේ අයිතිවාසිකම් පරාජය කිරීමට තුඩු දෙන ආකාරයකින් ක්‍රියා කරමින් සිටිති.

- එවකට සිටි උගත් දිසා විනිසුරුවරයා සිය ආඥාවෙහි අනෙකුත් කරුණු අතරතුර, තවදුරටත් මෙසේ නිරීක්ෂණය කර සිටින්නේය:


> "ඒ අනුව වත්මන් තත්වය නම්, විත්තිකරුවන් විසින් කොන්ත්‍රාත්තුවල ඔවුන්ගේ කොටස් ඉටුකර ඇති බවටත්, ඒවා භාර ගැනීමට සමාගම කැමැත්ත දක්වා ඇති බවටත්, විත්තිකරුවන් විසින් කරන ලද ප්‍රකාශ, ගෙවීම් කිරීම සඳහා පදනම වශයෙන් පිළිගැනීමට නොහැකි වීමය .... සත්‍ය වශයෙන්ම, පැමිණිලිකරු (එසේ සඳහන් කර ඇත්තේ 4 වන විත්තිකරුය) විසින් සඳහන් කර ඇති පරිදි, මෙය විදේශ විනිමය විශාල ප්‍රමාණයක් මෙරටින් වෙන අතකට හැරවීමේ වක්‍ර ක්‍රමයක්ද ? ..... මෙයින් පෙන්නුම් කරන වැදගත්කම නම්, සාමාන්‍යයෙන් මුදල් ගෙවීමට ඇති සමාගම විසින්, ඒ තත්වය සම්බන්ධයෙන් ප්‍රශ්ණ නැගීමේ හැකියාව සහ අනිත් පාර්ශවකරුවන්ට හිතුවක්කාර ලෙස ක්‍රියා කිරීමට ඉඩ නොදීමයි. මේ බව පැහැදිළි වන තත්වය නිවැරදි නම් මෙය වූ කලී, සත්‍ය වශයෙන්ම වංචනික සහයෝගීත්වයෙන් ක්‍රියා කරන අවස්ථාවකි."

මෙහි විශේෂත්වයක් වූයේ හිල්ටන් හෝටලය අයිති සමාගම, එනම් හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගම වෙනුවෙන් පෙනී සිටියේ එවකට ගරු. නීතිපතිතුමා වූ ජනාධිපති නීතිඥ සුනිල් ද සිල්වා වන අතර, කර්තෘගේ මෙම නඩුවට විරුද්ධ නොවීම සහ මෙම නඩුවේ ඉහතකී විමර්ශනයට සහභාගී නොවී සිටිමයි.

ඒ අතර තුරේදී, සිවිල් නඩු විධාන සංග්‍රහයේ විධි විධාන අනුව පැමිණිලිකාර කර්තෘ විසින් ජපන් සමාගම් වලට අදාල සියලු ලේඛන ඉදිරිපත් කිරීමටත්, ඒවායේ පිටපත් ලබා ගැනීමටත් කොළඹ දිස්ත්‍රික් අධිකරණයෙන් නියෝග ලබාගත් අතර, විචාරණ මාලාවකට ජපන් සමාගම් වලට උත්තර දීමටද නියෝග ලබා ගත්තේය. නමුත් මෙම නියෝග අනුව ජපන් සමාගම් ක්‍රියා කිරීමට අපොහොසත් වූ බැවින්, එයින් යථාර්ථයන් මනාසේ එළිදරව් විය.

මීට අමතරව, හිටපු ගරු. නීතිපතිතුමා ජනාධිපති නීතිඥ සුනිල් ද සිල්වා විශ්‍රාම ගැනීමත් සමගම, නව ගරු. නීතිපතිතුමා වූ ජනාධිපති නීතිඥ ටි. ජේ. මාරපන විසින් මවිතයට පත්කරවන ලෙස, අධිකරණය විසින් පත් කළ ඉන්ජිනේරුවරුන්ගේ කණ්ඩායමකින් සමන්විත කොමිසමක් මගින්, හිල්ටන් හෝටලය පරික්ෂා කොට, අධිකරණයට වාර්තාවක් ඉදිරිපත් කරන මෙන් පැමිණිලිකාර කර්තෘ විසින් කළ ඉල්ලීමට විරුද්ධ වීම, 'බළලා මල්ලෙන් එළියට පැනීම' වැනි දෙයක් පිලිඹිබු නොකරන්නේද? මෙවැනි ක්‍රියා මගින් එළිදරව් වන්නේ දේශපාලනික සහ සමාජීය බලපෑම් වල යථාර්ථය නොවේද ?

ජපන් සමාගම් විසින් ඉහතකී කොළඹ දිස්ත්‍රික් අධිකරණයේ නියෝගයට එරෙහිව අභියාචනාධිකරණයට ඉදිරිපත් කළ ඉල්ලීම් වලට එරෙහිව පැමිණිලිකාර කර්තෘ  විරුද්ධ වූ නමුත්, කොළඹ දිස්ත්‍රික් අධිකරණයේ විමර්ශනයන්ට සහභාගි නොවූ හිටපු ගරු. නීතිපතිතුමා විශ්‍රාම ගැනීමෙන් පසු නව ගරු. නීතිපතිතුමා වශයෙන් පත් වූ ජනාධිපති නීතිඥ ටි.ජේ. මාරපන පුදුමාකාර ලෙස ජපන් සමාගම් වෙනුවෙන්, ඔවුනට පක්ෂව උපකාර කිරීම පිණිස ඉදිරිපත් වූයේය.



and misrepresentations to pass, was present as a member. He was also a Director of LB Finance at the time whose Group Chairman's activities were being called into question here. In keeping with Section 9 of the Securities Council Act No: 36 of 1987, he should have disclosed his status as an interested and affected party and withdrawn from the proceedings.

Ameresekere and his battery of distinguished lawyers have established a pioneering action in the court proceedings against the directors of the company for aiding and abetting Mitsui/Taisei in their alleged attempt to defraud the shareholders, the chief of whom is the Government. The lengthy and detailed correspondence undertaken by and on behalf of Ameresekere with the SEC shows clearly, through the SEC's shallow and evasive replies, that what has happened at that end is its deliberate and determined endeavour to do nothing at all. The additional question for ordinary citizens concerns the fact that if Ameresekere -- a man of resources and tenacity, a fully-qualified accountant of stature and seniority in the profession -- cannot make himself heard by the SEC, what can the rest of us expect of this institution which has been set up to "protect the interests of investors"?

Mr. K. N. Choksy's involvement in the cover up is perhaps the most shocking of all. A Director of HDL, Choksy acted as a cat's paw of the Japanese contractors. Soon after Ameresekere informed the Board of Directors that the Colombo Hilton Hotel had been constructed on the basis of a reduced number of rooms (387 instead of 452) without prior approval or revised profitability forecasts, the Japanese Executive Director had intimated that the Japanese architects had conducted their final inspection in March 1988. In the light of the serious discrepancies that had come to light by then, a government-appointed Director, chartered accountant M. T. L. Fernando had urged the Board that an independent engineering examination and inspection be carried out, stressing the obvious connections between the Japanese contractors Mitsui/Taisei and the Japanese Architects.

It is a telling irony that in this situation the Japanese Executive Director had to seek refuge in Choksy, Member of Parliament and legal luminary in order to do his dirty work. Choksy advised the Board of Directors by letter dated 8/8/88 that it was not necessary to conduct an independent inquiry and that Mitsui/Taisei would not be bound by it. Choksy also stated that the architect's "inspection and certification is an adequate protection to both the Board and the shareholders that the construction is in order in every respect." All this on the basis of a "Completion Certificate" submitted by the architects Kanko Kikako Sekkeisha Yozo Shibata & Associates, a two paragraph letter dated 30/04/1987 without Bills of Quantities or Final Measurements to support it. It does not take an accountant, much less a legal mind, to discern that such a certificate is inadequate in the best of circumstances. In the light of the charges levelled by Ameresekere at Board Meetings and in writing, Choksy's behaviour is inexplicable except on the grounds of personal gain. In fact, on 28/02/1990 he writes reiterating his position that both the Certificate of Practical

16 — Counterpoint — December 1993

*Courtesy :* **Counterpoint Magazine**

ඒ ආකාරයෙන්ම, හිල්ටන් හෝටලය අයිති සමාගම, එනම් හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ විත්තිකරුවන් වූ අධ්‍යක්ෂකවරුන් තිදෙනෙකු විසින් නීතිඥවරයෙකු මාර්ගයෙන් ඔවුන් වෙනුවෙන්ද අභියාචනාධිකරණයේදී පෙනී සිටිමෙන්, ජපන් සමාගම් වලට සහාය දැක්වීම පුදුම සහගතව වංක ලෙස යථාර්ථයක් පිළිඹිබු නොවන්නේද ?

මෙම අධ්‍යක්ෂකවරුන්ගෙන් හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ එක් අධ්‍යක්ෂකවරයෙකු වුයේ ප්‍රධාන වරදකරුවෙකු සහ විත්තිකරුවෙකු ලෙස නම්කර තිබු පාර්ලිමේන්තු මන්ත්‍රී ජනාධිපති නීතිඥ කේ.එන්. චොක්සිය. ඉන් අනතුරුව, පාර්ලිමේන්තු මන්ත්‍රී ජනාධිපති නීතිඥ කේ.එන්. චොක්සිගේ දේශ ද්‍රෝහී ක්‍රියාකාරකම් මත, අභියාචනාධිකරණය විසින් ජපන් සමාගම් වලට අභියාචනා ඉදිරිපත් කිරීමට අවසර දෙන ලද අතර, මැදිහත් වීමට අයිතියක් නොතිබුණ ඉහතකී පාර්ශවයන්ට මැදිහත් වීමටද අවසරය ලබා දෙන ලදී. පසුව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඔවුන්ගේ මැදිහත්වීම ප්‍රතික්ෂේප කරන ලදී.

ඒ විගසම පැමිණිලිකාර කර්තෘ විසින් ඉහත අභියාචනාධිකරණයේ නියෝගය අභියෝගයට ලක්කරමින්, ශ්‍රේෂ්ඨාධිකරණයට විශේෂ අභියාචනයක් ගොනු කළ අතර, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් එයට අවසර දෙනු ලැබිය.

ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාග කිරීමෙන් අනතුරුව, ඉතාමත් ප්‍රබල ලිඛිත දේශන ඉදිරිපත් කොට, ඒ අනුව ශ්‍රේෂ්ඨාධිකරණයේ මුලසුන හෙබවූ අගවිනිසුරු ජී.පි.එස්. ද සිල්වා ඇතුළු ආචාර්ය ඒ.ආර්.බි. අමරසිංහ සහ කේ.එම්.එම්.බි. කුලතුංග යන විනිසුරු මඩුල්ල විසින් එම නඩුව විභාග කර, කොළඹ දිස්ත්‍රික් අධිකරණය විසින් නිකුත්කර තිබු ඉහතකී අතුරු තහනම් නියෝග තහවුරු කොට, අනාවරණය කර ඇති කරුණු මත, මෙය මහා පරිමාණ වංචාවක් බව හෙළිදරව් වන බවත්, පැමිණිලිකාර කර්තෘට මෙම නඩුව පහසුවෙන් ඔප්පු කර ජය ගත හැකි නඩුවක් බවටත් ප්‍රකාශ කරන ලදී.

ශ්‍රේෂ්ඨාධිකරණය විසින් 1992 දෙසැම්බර් මස ප්‍රබල ඓතිහාසික නඩු තීන්දුව පහත සදහන් පරිදි ප්‍රකාශ කළ අතර, ශ්‍රී ලංකා රජය ඇපකරු හැටියට රජයේ අධ්‍යක්ෂකවරුන් මේ පිළිබද නොතැකීම එහිදී දැඩි විවේචනයට ලක් කොට ඇත.

- පැමිණිලිකරුට (යොමු කිරීම 4 වන විත්තිකරුටය) නීතියෙන් බලාත්මක කළ හැකි අයිතිවාසිකම් ඇති බව සහ බරපතල ප්‍රශ්ණයන් සහ වැරදි කරන්නන්ගේ පාලනයක් වංචාව පිළිබඳ බලු බැල්මට පෙනෙන නඩුවක් ඇති බවත්, තවද, හිමිකම්පා ඇති සහන වලට එච්ඩීඑල් සමාගමට හිමිකම් ඇති බවත්, තහවුරු කිරීමට පැමිණිලිකරු සමත් වී ඇත.

- විත්තිකරුවන්ගේ උත්තරවාද විරෝධතා සහ කරුණු ඉදිරිපත් කිරීම්වල මතු කරන ලද විත්තිවාචක ඉදිරියේ පවා පැමිණිලිකරුට (යොමු කිරීම 4 වන විත්තිකරුටය) සාධාරණය සහ නිත්‍ය ජයග්‍රහණය පිළිබඳ බලාපොරොත්තුවක් ඇත.

- පැමිණිලිකරුට (යොමු කිරීම 4 වන විත්තිකරුටය) ජයග්‍රහණය පිළිබඳ බලාපොරොත්තුව නියම බලාපොරොත්තුවක් වන අතර, එය මති මාත්‍රයක් පමණක් නොවේ. ඔහුට තර්ක කළ හැකි නඩුවකට වඩා වැඩි දෙයක් ඇත.

- නඩුවේ අවස්ථාගත කරුණු නිසා අධ්‍යක්ෂ මණ්ඩලයේ රජයේ නියෝජිතයන් ඇතුළුව අධ්‍යක්ෂකවරුන් විසින් උපකාර නොකරනු ඇත. එසේ නැතහොත් මෙහිදී මැදිහත් වීමට නොහැකිව ඔවුහු අසරණ තත්වයක සිටිති.

- එච්ඩීඑල් සමාගමේ මුදල් වෙනතකට හරවා ගැනීමට සහ මෙරට මුදල් වෙනතකට හරවා ගැනීම් වැළැක්වීමට අතුරු තහනම් නියෝග ප්‍රදානය කර ඇත.

- අතුරු තහනම් නියෝග නිසා නොවේ නම්, එච්ඩීඑල් සමාගමට අප්‍රලියා හි අස්කියුලම් යුද්ධයෙන් පසු පයිරස්ට මෙන් "මෙවැනි තව එක් ජයග්‍රහණයක් ලැබුණොත් අපගේ අවසානය එයයි" යනුවෙන් කියන්නට සිදුවන්නට තිබුණි.

- එය සම්පූර්ණයෙන්ම රජය කෙරෙහි නොසැලකිලිමත්භාවය පිළිබඳ කාරණයක් වන්නට තිබුණේ යැයි පෙන්වා දිය හැකිය ..... රජයට අවසානයේදී එච්ඩීඑල් සමාගම විසින් ණයට ගත් මුදල් ආපසු ගෙවීමේ වගකීම භාර ගැනීමට සිදු කරන ලදී.

උත්තරිතරම අධිකරණය වූ ශ්‍රේෂ්ඨාධිකරණය ලබා දුන් මෙම ඓතිහාසික නඩු තීන්දුව 1992 වර්ෂයේ පොදු රාජ්‍ය මණ්ඩල වාණිජ නීති වාර්තාවන්හි ඓතිහාසික නඩු තීන්දුවක් ලෙස ඇතුලත් කර තිබුණි.– [1992] LRC (Comm) @ 636 – *Ameresekere v Mitsui & Co. Ltd. and Others.*

636 Sri Lanka [1992] LRC (Comm)

**Sri Lanka** *a*

## Amerasekere v Mitsui & Co Ltd and Others

Supreme Court *b*
G P S de Silva CJ, Amerasinghe and Kulatunga JJ
18, 19 November, 2 December 1992

(1) *Company law – Minority shareholder – Locus standi – Whether minority shareholder having locus standi to bring action on behalf of company.* *c*
(2) *Remedies – Injunction – Interim injunction – Minority shareholder seeking injunction to restrain payments by company to third parties – Principles to be applied – Whether prima facie case with real prospect of success.*
(3) *Remedies – Injunction – Interim injunction – Minority shareholder seeking injunction restraining company from making payments to foreign third parties – Whether damages an adequate remedy.* *d*

ව්‍යුත්පන්න නඩුවක් ලෙස හඳුන්වනු ලබන්නේ, සමාගමක් පාලනය කරන අධ්‍යක්ෂකවරුන් බහුතරයක් සමාගමට වංචාවක් කිරීමට ඉඩදීම සහ එය වැලැක්වීමට ඉදිරිපත් නොවීමෙන්, එම සමාගමේ ඕනෑම කොටස්කරුවෙකුට, එම සමාගමේ වංචාවට එරෙහිව, සමාගම වෙනුවෙන්, සමාගමේ අයිතීන් සහ සමාගමට ප්‍රතිලාභ ලබා ගැනීමට නීතිමය නෛතික අයිතියක් උරුම කරමින් පවරන නඩු නිමිත්තකි.

ඉන්පසුව, 1997 ඔක්තෝබර් මස එල්ටීටීඊ සංවිධානය විසින් සිදු කරන ලද බෝම්බ පිපිරීමකින්, කොළඹ හිල්ටන් හෝටලයද ඇතුළුව, කොළඹ නගර මධ්‍යයේ පිහිටි ගොඩනැඟිලි කිහිපයක් දරුණු ලෙස හානියට පත්විය. එම පසුබිම මත, ජාත්‍යන්තර හිල්ටන් සමාගම විසින්, කොළඹ හිල්ටන් හෝටලය නැවත ස්ථාපිත කිරීම සඳහා, විදේශ රක්ෂණ සමාගමකින් ව්‍යාපාරයට බාධාවීමේ රක්ෂණ ප්‍රතිපත්තිය යටතේ, රක්ෂණ දීමනාවක් ලෙස, ඇමරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 10 ක ගෙවීමක් ලබා ගන්නා ලදී.

ජාත්‍යන්තර හිල්ටන් සමාගම විසින්, ඔවුන්ගේ 1998 ජනවාරි මස 16 වැනි දිනැති පහත සඳහන් ලිපිය මගින්, මෙම රක්ෂණ ගෙවීම වූ, එක්සත් ජනපද ඩොලර් මිලියන 10, ඔවුනට අයිති බව පවසමින්, එයින් එක්සත් ජනපද ඩොලර් මිලියන 7 ක වටිනාකමට, හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) සමාගමේ කොටස් නාමික මිලට ඔවුනට ලබා දෙන මෙන්ද, ඉතිරි එක්සත් ජනපද ඩොලර් මිලියන 3, මාස 30ක් ඇතුලත කොටස් වශයෙන් නැවත ගෙවන ලෙසද ඉල්ලා සිටියේ, අනාගත රක්ෂණ ගෙවීම වැඩි වන බව සඳහන් කරමිනි - *එනම්:*

COLOMBO

HILTON

SRI LANKA

*An Oasis in the City*

16th January 1998

Mr. Daya Liyanage
Chairman
Hotel Developers Lanka Ltd
COLOMBO 1

Dear Mr. Liyanage,

**<u>COLOMBO HILTON</u>**
**<u>DAMAGE CAUSED TO THE RECENT BOMB BLAST.</u>**

XXXXXXXXX

As also explained to you at that discussion, although Hilton has no legal obligation to contribute to the cost of reconstructionn and refurbishment of the Hotel, Hilton has negotiated, which will be for the well being of the Owners, payment of insurance money which will cover the cost of reinstatement. The likely cost of reinstatement is in the region of US$. 10 million.

XXXXXXXXX

In consideration of making available these insurance funds, Hilton requires US$ 3 million and repayment would be within a period of 30 months in consecutive monthly instalments of US$ 100,000/-. No interest will be payable on this money.

Hilton will not expect the balance sum paid to the Owning Company to be repaid in money, and will accept an allotment of shares in the Company in consideration of such sum.

XXXXXXXXX

The participation by Hilton in the equity of the Owning Company in this manner will forge closer links between Hilton the Owning Company and also reflect the confidence Hilton has in its long term arrangements with the Owning Company.

XXXXXXXXX

Yours sincerely

ROY COXON
GROUP RISK MANAGER
HILTON INTERNATIONAL CO.

cc: Mr Gamini Fernando
General Manager & Division Director

කර්තෘ, හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) සමාගමෙහි අධ්‍යක්ෂක ලෙස එම ස්ථාවරය තරයේ හෙලා දැක, ගරු නීතිපතිතුමාගේද එකඟත්වය ඇතිව, එසේ ලැබෙන රක්ෂණ මුදල්, හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) සමාගමට අයිති බව, සහ ජාත්‍යන්තර හිල්ටන් සමාගමට එය අයිති නොවන බව, සාර්ථක ලෙස සනාථ කර ගෙන තිබුණි.

හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) සමාගමේ අධ්‍යක්ෂක ලෙස කර්තෘගේ එවැනි ස්ථාවරයක් නොතිබුණි නම්, එවකට හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) සමාගමේ රු. මි. 452.3 වූ කොටස් ප්‍රාග්ධනය, එවකට එක්සත් ජනපද ඩොලරයක මිල රු. 61/- ක බැගින්, හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) සමාගමේ රු. මි. 427 ක කොටස් මිල වටිනාකමකට ජාත්‍යන්තර හිල්ටන් සමාගමට අත්කර ගැනීමට තැත් කරනු ඇත.

ඒ අනුව යෝජිතව තිබු මුළු කොටස් වල වටිනාකම රු.මි. 879.3 වූ අතර, එයින් 48.5% ජාත්‍යන්තර හිල්ටන් සමාගමට අයිති වන අතර, මෙම ජපන් සමාගම් වලට එයින් 14.2% ක් අයිති වී, දෙපාර්ශවයන් අතර මුළු කොටස් 62.7% අත්පත් කර ගැනීමට උත්සාහය දරනු ලැබුයේ, එමගින් ශ්‍රී ලංකා රජයේ කොටස් ප්‍රමාණය 33.4% ක් පමණක් දක්වා අඩු කරමිනි. මෙම අසාර්ථක උත්සාහය මගින්, පුදුමාකාර ලෙස කොළඹ හිල්ටන් හෝටලයේ අයිතිය තමන් සතු කර ගැනීමට, ඔවුන් 'උපක්‍රමික' ලෙස ක්‍රියා කල ආකාරය පිලිඹිඹු වේ !